ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

පුවත්පත් නිවේදනය

<u>ඉන්දීය ප්‍රදාන යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ ඉදිකළ මහත්මා ගාන්ධි **ආදර්ශ** ගම්මානය විවෘත කෙරේ</u>

ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මැතිතුමා සහ නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍ය වෛද්‍ය සුසිල් රණසිංහ මැතිතුමා ඔක්තෝබර් 29 වන දින අම්පාර දිස්ත්‍රික්කයේ මහත්මා ගාන්ධි ආදර්ශ ගම්මානය විවෘත කර ප්‍රතිලාභී පවුල් 24 වෙත භාර දුන්හ. නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ටී.බී. සරත්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් නියෝජ්‍ය අමාත්‍ය වසන්ත පියතිස්ස සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රියන්ත විජේරත්න යන මහත්වරු ද මෙම අවස්ථාවට සහභාගී වූහ.

2. නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නැගෙනහිර පළාත් සභාවේ සහ අම්පාර දිස්ත්‍රික් පරිපාලනයේ නිලධාරීන් ඇතුළු රැසක් ද මෙම උත්සවය සඳහා සහභාගී වූහ.

3. නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව ඉන්දීය ප්‍රදාන යටතේ ආදර්ශ ගම්මාන නිවාස ව්‍යාපෘතිය දිවයිනේ දිස්ත්‍රික්ක 25 තුළම ක්‍රියාවට නැංවේ. ඉන්දීය රජය සහ ශ්‍රී ලංකා රජය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා වන අවබෝධතා ගිවිසුමට 2017 ඔක්තෝබර් මාසයේදී අත්සන් තබන ලදි. මෙම ව්‍යාපෘතිය යටතේ දිස්ත්‍රික් නිවාස කමිටු විසින් තෝරා ගන්නා ලද පවුල් සඳහා දිස්ත්‍රික්කයකට නිවාස 24කින් සමන්විත ආදර්ශ ගම්මානය බැගින් ශ්‍රී ලංකාවේ අඩු ආදයම්ලාභී පවුල් 600ක් සඳහා නිවාස ඉදි කෙරේ.

4. මෙම ව්‍යාපෘතිය යටතේ මඩකලපුව, වවුනියාව, යාපනය, මහනුවර, ගම්පහ, අනුරාධපුර, බදුල්ල, මාතලේ, පුත්තලම, කොළඹ, ත්‍රිකුණාමලය, මොනරාගල, කිලිනොච්චි, මන්නාරම, මුලතිවු සහ රත්නපුර යන දිස්ත්‍රික්ක 16 හි ආදර්ශ ගම්මාන විවෘත කර ප්‍රතිලාභීන් වෙත භාර දී ඇත. ව්‍යාපෘතියේ ප්‍රගතිය 98%කට ආසන්න අතර ඉතිරි ආදර්ශ ගම්මාන ද නුදුරේදීම ප්‍රතිලාභීන් වෙත භාර දීමට නියමිතය.

****

**කොළඹ**

***2025 ඔක්තෝබර් 30***